(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(11).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 සැප්තැම්බර් 26 සිකුරාදා**

---

**2025 ඔක්තෝබර් 07 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— පරිපූරක මුදල,— ශීර්ෂය 117 — වැඩසටහන 02 — † 2025 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් තිස්හය බිලියන හයසිය නව මිලියනයක් (රු. 36,609,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

*උපලේඛනය*

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **117** | - | ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා | |
| **වැඩසටහන** | **02** | - | සංවර්ධන වැඩසටහන | |
| | | | ප්‍රාග්ධන වියදම් | රු. 36,609,000,000 |
| | | | **මුළු වියදම** | **රු. 36,609,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2025 සැප්තැම්බර් 25 දින ඉදිරිපත් කරන ලද 2025 අංක 3 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

පරිපූරක ඇස්තමේන්තු අංක 1 සහ 2 එකතුව රු. 14,785,600,000

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2025 ඔක්තෝබර් 09 බ්‍රහස්පතින්දා)**

543/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) කැබිනට් අමාත්‍යාංශ සඳහා පත් කර ඇති මුළු උපදේශකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් උපදේශකයාගේ නම, පත් කරන ලද දිනය, අධ්‍යාපන සුදුසුකම්, ගෙවනු ලබන මාසික වැටුප හා දීමනා, පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුරු, ඔහුට/ඇයට වාහන ලබාදී තිබේ නම් වාහනයේ අංකය, වාහනයේ වර්ගය, වාහනය වෙනුවෙන් ලබා දෙන මාසික ඉන්ධන දීමනාව, ඔහුට/ඇයට කාර්යාලයක් ලබාදී තිබේ නම් එම කාර්යාලය පිහිටි ස්ථානය සහ එම කාර්යාලය සඳහා ගෙවනු ලබන මාසික කුලිය එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

545/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) නියෝජ්‍ය අමාත්‍යවරයකුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා අනුමත නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නියෝජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා පත් කර ඇති එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය, පත් කරන ලද දිනය, ගෙවනු ලබන මාසික වැටුප හා දීමනා, එම වැටුප පෞද්ගලික බැංකු ගිණුමකට බැර නොවන්නේ නම් එය බැර කරනු ලබන බැංකුව, ගෙවනු ලබන වෙනත් දීමනා, ඔහුට/ඇයට වාහන ලබාදී තිබේ නම් එම වාහනයේ අංකය, වාහනයේ වර්ගය සහ වාහනය වෙනුවෙන් ලබා දෙන මාසික ඉන්ධන දීමනාව එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

546/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු වන අමාත්‍යවරයකුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා අනුමත නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා පත් කර ඇති එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය, පත් කරන ලද දිනය, ගෙවනු ලබන මාසික වැටුප හා දීමනා, එම වැටුප පෞද්ගලික බැංකු ගිණුමකට බැර නොවන්නේ නම් එය බැර කරනු ලබන බැංකුව, ගෙවනු ලබන වෙනත් දීමනා, ඔහුට/ඇයට වාහන ලබාදී තිබේ නම් එම වාහනයේ අංකය, වාහනයේ වර්ගය සහ වාහනය වෙනුවෙන් ලබා දෙන මාසික ඉන්ධන දීමනාව එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2025 ඔක්තෝබර් 10 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

**2025 ඔක්තෝබර් 21 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

725/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඇති පීඨවල මේ වනවිට ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව එක් එක් පීඨය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාලයේ මේ වනවිට නවකවදය ඉතා උග්‍ර ලෙස ක්‍රියාත්මක වන බව දන්නේද;

(iii) එසේ නම්, එම තත්ත්වය පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

825/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සහ එයට අනුබද්ධ ආයතන විසින් මිලදී ගනු ලබන ඖෂධ සඳහා වර්ෂයකට වියදම් කරනු ලබන මුළු මුදල කොපමණද;

(ii) එම මුදල, අමාත්‍යාංශය සහ එයට අනුබද්ධ එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වාර්ෂික ඖෂධ අවශ්‍යතාවයෙන් දේශීය වශයෙන් මිලදී ගනු ලබන ඖෂධ ප්‍රමාණය, විදේශීය වශයෙන් මිලදී ගනු ලබන ඖෂධ ප්‍රමාණය සහ ඒ සඳහා වැය වන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඖෂධ ඇණවුම් කිරීමේ කාල වකවානු තීරණය කිරීමේ ක්‍රමවේදය කවරේද;

(v) ඇණවුම් කරන ලද යම් ඖෂධයක් සැපයීම ප්‍රමාද වන්නේ නම්, ඊට වගකිවයුතු නිලධාරියා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

859/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, බදු පදනම මත ලබාදී තිබෙන රජයේ ඉඩම් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 153 ග්‍රාම නිලධාරි වසමේ, කොඩින්නෑව ගමේ පිහිටි අක්කර 100ක් පමණ විශාලත්වයකින් යුතු රජයේ ඉඩම අනවසරයෙන් එළිපෙහෙළි කර අස්වද්දා ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එම ඉඩම එළිපෙහෙළි කර අස්වද්දා ඇත්තේ කවුරුන් විසින්ද;

(iv) එම පුද්ගලයන්ට ඒ සඳහා නීත්‍යානුකූල අයිතියක් තිබේද;

(v) ඔවුන් පොහොර සහනාධාරය ලබා ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පොහොර සහනාධාරය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

879/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී මන්මුනෙපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු (Deed of Grant) හෝ ඉඩම් බලපත්‍ර (Land permit) ලබාදී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මන්මුනෙපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචිවී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

901/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් සිටින්නේද;

(iii) ඒවාට අවශ්‍ය ඉංජිනේරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම සංඛ්‍යාව සිටින්නේද;

(v) නොඑසේ නම්, ඉංජිනේරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(vi) නව ඉංජිනේරුවන් බඳවා ගන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදුලිය උත්පාදනය කරන ප්‍රභවයන් කවරේද;

(ii) එම එක් එක් ප්‍රභවයෙන් මේ වනවිට උත්පාදනය කරන ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය පුද්ගලීකරණය කරන්නේද;

(iv) එසේ නම්, එහි සේවකයන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මණ්ඩලය යටතේ පවතින සමාගම්වල මේ වනවිට ආරම්භ කර ඇති උපාය මාර්ගික වැඩසටහන්/ව්‍යාපෘති කවරේද;

(ii) ඉහත එක් එක් සමාගමේ මේ වනවිට සේවය කරන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සමාගම්වල අතිරික්ත සේවකයන් සිටින්නේද;

(iv) එසේ නම්, අතිරික්ත සේවකයන් සංඛ්‍යාව එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ලංකා විදුලිබල සමාගම මඟින් ආවරණය කරන ප්‍රදේශ කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

958/2025

ගරු අජිත් ගිහාන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, පල්ලකන්දල් දේවස්ථානයේ ආගමික කටයුතු පවත්වාගෙන යාමට, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් බාධා කරන බව දන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

995/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ආහාර බෝග නිෂ්පාදනයේ යෙදී සිටින ගොවියාගේ ජීවන තත්ත්වය උසස් කළ යුතු බවත්;

(ii) ඒ සඳහා, ගොවීන් විසින් විශාල ශ්‍රමයක් සහ මුදලක් යෙදවිය යුතු බවත්;

(iii) එසේ වුවද, කෘෂි නිෂ්පාදන සඳහා ශ්‍රමයට සහ වියදමට සරිලන සාධාරණ මිලක් නොලැබීමෙන් ගොවීන් පීඩාවට පත් වී සිටින බවත්;

(iv) කෘෂි නිෂ්පාදන මිලදී ගැනීමේදී, පාරිභෝගිකයාටද ඉහළ මිලක් ගෙවීමට සිදුවී ඇති බවත්;

(v) ගොවියා සහ පාරිභෝගිකයා අතරමැද සිටින තොග වෙළෙන්දා සහ සිල්ලර වෙළෙන්දා විසින් අධික ලාභ ලබන බවත්;

(vi) ගොවියා සහ පාරිභෝගිකයා යන දෙදෙනාම පීඩාවට පත් කරන ඉහත ක්‍රමය වෙනස් කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ගොවියා, වෙළෙන්දා සහ පාරිභෝගිකයා යන තිදෙනාම ආරක්ෂා වන ආකාරයේ වැඩපිළිවෙළක් මේ සඳහා සකස් කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1313/2025

ගරු නිශාන්ත පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇල්පිටිය අධ්‍යාපන කලාපය තුළ පිහිටා ඇති රජයේ නොවන පාසැල් කවරේද;

(ii) එම එක් එක් පාසැල ආරම්භ කරන ලද වර්ෂය සහ පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාසැල් අධීක්ෂණය කරනු ලබන රජයේ ආයතන කවරේද;

(iv) මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශයට හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එම පාසැල් සම්බන්ධයෙන් මහජන පැමිණිලි ලැබී තිබේද;

(v) එම පාසැල්වලින් ලබා දෙන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ එම පාසැල්වල සිසුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1326/2025

ගරු සුජීව දිසානායක මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද පළමු බන්ධනාගාරය කවරේද;

(ii) එම බන්ධනාගාරය ආරම්භ කරන ලද අවස්ථාවේදී එහි රඳවන ලද රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට ශ්‍රී ලංකාවේ ඇති බන්ධනාගර සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා කවරේද;

(v) එම එක් එක් බන්ධනාගාරයේ මේ වනවිට රඳවා සිටින රැඳවියන් සංඛ්‍යාව ස්ත්‍රී හා පුරුෂ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) බන්ධනාගාරයක් තුළ එක් රැඳවියෙක් වෙනුවෙන් වෙන්කර ඇති ඉඩ ප්‍රමාණය වර්ග අඩි කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වයඹ පළාතේ ඇති විශාලතම බන්ධනාගාරය කවරේද;

(ii) එහි රැඳවා තැබිය හැකි උපරිම රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2025 අගෝස්තු මාසයේ එම බන්ධනාගාරයේ එක් දිනක රඳවා සිටි රැඳවියන්ගේ සාමාන්‍ය අගය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1343/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ල-මාදම්පේ ප්‍රධාන මාර්ගයේ, රත්නපුර දිසාවට හැරෙන දෙනියාය, 51 හන්දියේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු ඉඩමක් තිබේද;

(ii) එසේ නම්, එම ඉඩමේ වර්තමාන තත්ත්වය සහ භාවිතා කරනු ලබන කාර්යය කවරේද;

(iii) මීට පෙර ඉහත ඉඩමේ ඉන්ධන පිරවුම්හලක් පිහිටුවා තිබූ අතර මේ වනවිට එය වසා දමා ඇති බව දන්නේද;

(iv) එය වසා දැමීමට හේතු වූ කරුණු කවරේද;

(v) එම ඉඩමේ නව ඉන්ධන පිරවුම්හලක් ඉදිකිරීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර තිබේද;

(vi) එම ඉන්ධන පිරවුම් හල කඩිනමින් ඉදිකිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ඔක්තෝබර් 22 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

678/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට බදු ගෙවන ජනතාවට, මහා භාණ්ඩාගාරයට සහ රාජ්‍ය බැංකු වෙත විශාල වැය බරක් බවට පත්වී ඇති ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය කළ යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

738/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය දිනවල කොළඹ, බේරේ වැවේ මත්ස්‍යයන් මිය යාමේ සිද්ධියක් වාර්තාවූ බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද විශේෂඥ කමිටු වාර්තාවේ සඳහන් කරුණු කවරේද;

(iii) බේරේ වැවේ පමණක් නොව ශ්‍රී ලංකාවේ බොහෝ ජලාශවල ජලය අතිශය දූෂිතවී ඇති බැවින්, එම තත්ත්වය පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

808/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඝාතනයට, පැහැරගැනීමට සහ පහරදීමට ලක්වූ ජනමාධ්‍යවේදීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) එම ජනමාධ්‍යවේදීන්ට සාධාරණය ඉටු කිරීම සඳහා පැවැත්වෙන විමර්ශනවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

850/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් පවුල් සෞඛ්‍ය සේවිකාවන් විශාල සේවයක් සිදු කරන බව පිළිගන්නේද;

(ii) මේ වනවිට පවුල් සෞඛ්‍ය සේවිකා තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීමට පියවර ගන්නේද;

(iv) පවුල් සෞඛ්‍ය සේවිකාවන් සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1009/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මැර කණ්ඩායම්වල ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට රජය විසින් මූල්‍ය වන්දි, වෛද්‍ය ආධාර හෝ පුනරුත්ථාපන වැඩසටහන් වැනි නිශ්චිත ස්වරූපයේ ආධාර හඳුන්වාදී හෝ හඳුන්වා දීමට අදහස් කර තිබේද;

(ii) මැර කණ්ඩායම්වල ප්‍රචණ්ඩකාරී සිද්ධීන් ඇතිවූ දිස්ත්‍රික්ක හෝ පළාත් තුළ, එවැනි ආධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ වත්මන් තත්ත්වය කවරේද;

(iii) එවැනි වින්දිතයින්ට නිසි කලට සහයෝගය සහ දිගු කාලීන සහය ලබා දීම සහතික කිරීම සඳහා, පළාත් සභා හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත කිසියම් චක්‍රලේඛ, මාර්ගෝපදේශ හෝ ප්‍රතිපත්ති රාමු නිකුත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1160/2025

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කටුපොල් වගාව හා කටුපොල් බීජ ආනයනය කිරීම මේ වනවිට නීතියෙන් තහනම් කර තිබේද;

(ii) ශ්‍රී ලංකාවට කටුපොල් තෙල් ආනයනය කිරීම සඳහා වර්ෂයකට වැය කරනු ලබන මුදල කොපමණද;

(iii) කටුපොල් වගාව නැවත ආරම්භ කිරීම සඳහා පවතින බාධා කවරේද;

(iv) කටුපොල් වගාව සහ පාම් තෙල් නිෂ්පාදනය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1174/2025

ගරු සුනිල් රත්නසිරි මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකා පොලිසියේ මේ වනවිට සේවය කරනු ලබන මුළු නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකා පොලිසියේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් නිලය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම පුරප්පාඩු පුරවනු ලබන දිනය එක් එක් නිලය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2024 වර්ෂයේ සිට 2025 මැයි මාසය දක්වා අත්අඩංගුවට ගන්නා ලද සංවිධානාත්මක අපරාධකරුවන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ශ්‍රී ලංකා පොලීසියේ සිදුවන අක්‍රමිකතා හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම අක්‍රමිකතා මැඩපැවැත්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1211/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) 2024 සහ 2025 වර්ෂවල යල කන්නයේ අම්පාර දිස්ත්‍රික්කයේ මුළු වී අස්වැන්න සහ එම අස්වැන්නෙන් වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගෙන ඇති ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති වී අලෙවි මණ්ඩලයේ ගබඩා සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් ගබඩාවේ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත (iii)හි සඳහන් වී ගබඩා අතරින් වී වියළන යන්ත්‍ර සවිකර ඇති ගබඩා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1283/2025

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විකල්ප මාර්ග කිලෝ මීටර් ලක්ෂයක් සංවර්ධනය කිරීමේ වැඩසටහනට ඇතුළත් කර ඇති කළුතර දිස්ත්‍රික්කයේ මාර්ග කවරේද;

(ii) ඒ අතරින් මේ වනවිට සංවර්ධන කටයුතු අවසන් කර ඇති මාර්ග සහ අවසන් කර නොමැති මාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් මාර්ගය වෙනුවෙන් වැය කර ඇති මුළු පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් මාර්ගයේ සංවර්ධන කටයුතුවල ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සංවර්ධන කටයුතු අවසන් කර නොමැති මාර්ගවල වැඩ කටයුතු අවසන් නොකිරීමට හේතු කවරේද;

(ii) එම මාර්ග සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග තීරණය කර තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම මාර්ගවල නඩත්තු කටයුතු නිසි පරිදි සිදු කරන්නේද;

(v) ඉහත වැඩසටහන වෙනුවෙන් වෙනත් ආයතනවලට පවරා ගන්නා ලද මාර්ග, නැවත අදාළ ආයතන වෙත පවරාදී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1319/2025

ගරු චානක මාදුගොඩ මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය (Inclusive Connectivity and Development Project) ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ මේ වනවිට කාපට් අතුරා සංවර්ධනය කර ඇති මාර්ග දුර ප්‍රමාණය කොපමණද;

(iii) එම එක් එක් මාර්ගයේ නම සහ වැය කරන ලද මුදල දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වැඩ ආරම්භ කර, එහෙත් වැඩ අවසන් කර නොමැති මාර්ග සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ ඉහත ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ මේ වනවිට කාපට් අතුරා සංවර්ධනය කර ඇති මාර්ග දුර ප්‍රමාණය සහ එයට වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ගාල්ල දිස්ත්‍රික්කයට අදාළව එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(iv) ඉහත ව්‍යාපෘතිය ගාල්ල දිස්ත්‍රික්කය තුළ ආරම්භ කිරීමට දීර්ඝ කාලයක් ගතවීමට හේතු කවරේද;

(v) ඉහත ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ඔක්තෝබර් 23 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1084/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් වවුනියාවේ, තච්චංකුලම් ගුවන් තොටුපළ පුළුල් කිරීම සඳහා ඒ අවට පෞද්ගලික ඉඩම් අත්පත් කර ගන්නා ලද අතර එහිදී දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශයේ මහජනතාව විසින් භාවිතා කරන ලද මාර්ග භාවිතා කිරීමද තහනම් කර තිබෙන බවත්;

(ii) විශේෂයෙන්ම තච්චංකුලම්-මූන්රුමුරිප්පු ප්‍රධාන මාර්ගය භාවිතා කිරීම දීර්ඝ කාලයක් තිස්සේ මහජනතාවට තහනම් කර තිබෙන බවත්;

(iii) ඒ හේතුවෙන් තච්චංකුලම් ගම්මානයේ ජීවත්වන ජනතාවට තමන්ගේ අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා ග්‍රාම නිලධාරි කාර්යාලයට යාමට කිලෝ මීටර් දෙකක් වෙනුවට කිලෝ මීටර් දොළහක් ගමන් කිරීමට සිදුවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඉහත සඳහන් තච්චංකුලම්-මූන්රුමුරිප්පු ප්‍රධාන මාර්ගය මහජනතාවගේ භාවිතය උදෙසා විවෘත කිරීමට පියවර ගන්නේද;

(ii) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1115/2025

ගරු රොෂාන් අක්මීමන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්, ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරාදී ඇති දිනය කවරේද;

(iii) ඊට අදාළ නීතිමය ප්‍රතිපාදනය කවරේද;

(iv) එම ඉඩම් භාවිතා කළ හැකි අරමුණු කවරේද;

(v) පසුගිය කාලයේදී එම අරමුණුවලින් පරිබාහිර වෙනත් අරමුණු සඳහා ඉහත ඉඩම් බැහැර කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1181/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට උතුරු සහ නැගෙනහිර පළාත්වලින් විශාල ආර්ථික ආයකත්වයක් ලැබෙන බව දන්නේද;

(ii) වර්ෂ 2012 සිට 2019 දක්වා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මුළු ආදායම සහ උතුරු හා නැගෙනහිර යන එක් එක් පළාතේ ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) උතුරු පළාතේ දුම්රිය ස්ථානවල ස්ථානාධිපතිවරුන් හා සේවකයන් සංඛ්‍යාව සිංහල හා ද්‍රවිඩ භාෂා මාධ්‍යයන් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උතුරු හා නැගෙනහිර පළාත්වල ඇති මුළු දුම්රිය ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, ප්‍රධාන දුම්රිය ස්ථාන සහ උප දුම්රිය ස්ථාන අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වවුනියාවේ සිට කන්කසන්තුරෙයි දක්වා සහ මැදවච්චියේ සිට තලෛයිමන්නාරම දක්වා ඇති ප්‍රධාන දුම්රිය ස්ථාන සහ උප දුම්රිය ස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පළමුවන පන්තියේ නිදන මැදිරි පහසුකම් සහිත ගමනාන්ත කවරේද;

(v) යාපනය දුම්රිය සඳහා මේ දක්වා පළමුවන පන්තියේ නිදන මැදිරි පහසුකම් ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

1220/2025

ගරු සුරංග රත්නායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයේ මේ වනවිට රඳවා සිටින වනඅලින් සංඛ්‍යාව කොපමණද;

(ii) එයට අයත් භූමි ප්‍රමාණය අක්කර කොපමණද;

(iii) එම භූමිය තුළ තිබූ වගා ඉඩම් ප්‍රමාණය අක්කර කොපමණද;

(iv) එම ඉඩම් වෙනුවට අයිතිකරුවන්ට විකල්ප වගා ඉඩම් ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මධ්‍යස්ථානය අලිමංකඩක පිහිටුවීම හේතුවෙන් ඒ හරහා ගමන් කරනු ලබන වනඅලින් සඳහා විකල්ප මාර්ග නොමැති වීමෙන් වෙනත් වගා බිම් හරහා ගමන් කිරීම හේතුවෙන් වගා හානි සිදුවන බව දන්නේද;

(ii) ඒ සඳහා ලබා දෙන විසඳුම් කවරේද;

(iii) වනඅලින් සිදු කරනු ලබන වගා හානි සඳහා වන්දි ලබා දීමට ගත වන කාලය කොපමණද;

(iv) තම ඉඩම් සඳහා ඔප්පු හෝ අවසර පත්‍ර නොමැති ගොවීන්ට වගා හානි වෙනුවෙන් වන්දි නොගෙවන්නේද;

(v) එසේ නම්, ඔවුන්ට සාධාරණයක් ඉටුකරන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1236/2025

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ, මුසලි ප්‍රාදේශීය සභාවට අයත්, වේප්පම්කුලම් සිට සිලාවතුරෙ දක්වා වූ අභ්‍යන්තර මාර්ගය 2010 වර්ෂයේදී එවකට නැවත පදිංචි කිරීමේ හා ආපදා සහන සේවා අමාත්‍යාංශය විසින් ප්‍රතිසංස්කරණය කරන ලද බව දන්නේද;

(ii) ඉහත මාර්ගයේ දුර කොපමණද;

(iii) එම මාර්ගය කුමන ගම්මානයක් ඔස්සේ දිවෙන්නේද;

(iv) එහි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලද දිනය සහ අවසන් කරන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව සමාගම සමඟ එළඹී ගිවිසුමේ පිටපතක් ඉදිරිපත් කරන්නේද;

(ii) ගිවිසුමට එළඹෙන අවස්ථාව වනවිට සමාගමේ හිමිකරුවන් කවුරුන්ද;

(iii) එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සමාගමට වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) ඉහත මාර්ගය ප්‍රතිසංස්කරණය කර නොමැති බවත්, ඒ සඳහා වංචා සහගත ලෙස මුදල් ලබා ගෙන ඇති බවත් දන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1253/2025

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඇති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(ii) එම ඉඩම් අතරින් මේ වනවිට බෙදාදී ඇති විකල්ප ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(iii) එම විකල්ප ඉඩම් ලබාදී ඇති එක් එක් පුද්ගලයාගේ නම, ලබා දුන් ඉඩම් ප්‍රමාණය, ඉඩම් ලබා දීමේ පදනම සහ ඉඩම් ලබා දුන් කාල වකවානු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම විකල්ප ඉඩම් ලබා දුන් පුද්ගලයන්ගේ නාම ලේඛනයේ දේශපාලඥයන්ගේ නම් සඳහන්වී තිබේද;

(v) එසේ නම්, එම දේශපාලඥයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1254/2025

ගරු ඊ. එම්. බස්නායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන අවස්ථාවේදී, එම කොමිෂන් සභාවට අත්පත් කරගන්නා ලද මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ඉඩම් අතරින් නීත්‍යානුකූලව ඉඩම් බදුදී ඇති පුද්ගලයන් හා සමාගම්වල නම් සහ බදුදී ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පුද්ගලයන්ගෙන් සහ සමාගම්වලින් නියමිත පරිදි බදු අය කරන්නේද;

(iv) ඉහත (i)හි සඳහන් ඉඩම් අතරින් නීත්‍යානුකූල නොවන ආකාරයට ඉඩම් පරිහරණය කරන පුද්ගලයන් හා සමාගම්වල නම් කවරේද;

(v) එම පුද්ගලයන්ට/සමාගම්වලට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේ නම්, එහි වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1344/2025

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ-රඹුක්කන ප්‍රධාන දුම්රිය මාර්ගයේ, එඬේරමුල්ල උප දුම්රිය ස්ථානයේ, දුම්රිය වේදිකාව හා ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියක් 2018 වර්ෂයේදී සිදු කර ඇති බව දන්නේද;

(ii) ඒ සඳහා වැය කර ඇති මුළු මුදල කොපමණද;

(iii) එහිදී නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කර තිබේද;

(iv) ඊට අදාළ කොන්ත්‍රාත්කරු කවුරුන්ද;

(v) ඒ සඳහා තාක්ෂණික සහාය සහ අධීක්ෂණය කරන ලද ආයතන කවරේද;

(vi) මේ වනවිට අනතුරුදායක තත්ත්වයක පවතින තෙවන වේදිකාව සංවර්ධනය කිරීම සහ අබලන් තත්ත්වයේ පවතින ප්‍රධාන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම ඉහත ව්‍යාපෘතියට ඇතුළත්ව තිබුණේද;

(vii) ඉහත ව්‍යාපෘතියේ අරමුණ සාක්ෂාත්වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1361/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2021 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ රජයේ විශ්වවිද්‍යාලවලට ආයුර්වේද, සිද්ධ හා යුනානි වෛද්‍ය අධ්‍යාපනය හැදෑරීම සඳහා ඇතුළත් කරගනු ලැබූ සිසුන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ආයුර්වේද, සිද්ධ හා යුනානි වෛද්‍ය අධ්‍යාපනය හදාරා, සීමාවාසික පුහුණුව අවසන් කර, මේ වනවිට රැකියා අපේක්ෂාවෙන් සිටින වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) සිද්ධ රෝහල් සහ ආයුර්වේද රෝහල්වල ආයුර්වේද, සිද්ධ හා යුනානි වෛද්‍යවරුන් සඳහා අනුමත කාර්ය මණ්ඩලය, මේ වනවිට සේවය කරනු ලබන කාර්ය මණ්ඩලය සහ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) කාර්යක්ෂම දේශීය වෛද්‍ය සේවාවක් ලබා දීම සඳහා, මේ වනවිට රැකියා විරහිත දේශීය වෛද්‍ය උපාධිධාරීන්ට රජයේ ආයුර්වේද රෝහල්වල පත්වීම් ලබා දීමට ඇති බාධාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1427/2025

ගරු තිළිණ සමරකෝන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මගී ප්‍රවාහන බස්රථ සඳහා ලබා ගන්නා රක්ෂණ ආවරණය කවරේද;

(ii) මගී ප්‍රවාහන බස්රථ සඳහා තෙවන පාර්ශ්ව රක්ෂණ ආවරණය ප්‍රමාණවත් වන්නේද;

(iii) ඉදිරියේදී එම රක්ෂණ ආවරණය වෙනුවට වෙනත් රක්ෂණ ආවරණයක් ලබා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවල මේ වනවිට සේවය කරනු ලබන කාර්මික නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

(ii) එම ඩිපෝවල කාර්මික අංශ සඳහා පුහුණුවලත් කාර්මිකයන් සිටින්නේද;

(iii) නිසි පුහුණුවකින් පසු එම ඩිපෝ සඳහා කාර්මිකයින් බඳවා ගැනීමට විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) කාර්මික අධ්‍යාපනය ලබා දෙන ආයතන මඟින් ප්‍රායෝගික පුහුණුව සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ වෙත යොමු කරනු ලබන අභ්‍යාසලාභීන්, පුහුණු කාලයෙන් පසු ස්ථිර පදනම මත බඳවා ගැනීමට වැඩපිළිවෙළක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ඔක්තෝබර් 24 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

19/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ලක්හඬ' ගුවන් විදුලි සේවය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එය ආරම්භ කිරීමේ අරමුණු කවරේද;

(iii) 2018 වර්ෂයේ සිට මේ දක්වා එම සේවයේ ආදායම/වියදම සහ ලාභ/අලාභ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කාලසීමාව තුළදී එම ගුවන් විදුලි සේවයේ වෙළඳපොළ ස්ථානය (rating) එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම කාලසීමාව තුළ ඉහත ගුවන් විදුලි සේවයට බඳවාගන්නා ලද සේවකයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, ලිපිනයන් සහ තනතුරු නාම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ගුවන් විදුලි සේවය මේ වනවිට ස්වාධීන රූපවාහිනී සේවයට විශාල බරක්වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1288/2025

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බොරලු කැපීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බලපවත්වන නීති කවරේද;

(ii) එම නීති අනුව බොරලු කැපීම සඳහා නිර්දේශ ලබා දිය යුත්තේ කවුරුන් විසින්ද;

(iii) ඒ සඳහා අනුමතිය ලබා දිය යුත්තේ කවුරුන් විසින්ද;

(iv) කිසියම් ස්ථානයක බොරලු කැපීම සඳහා අනුමතිය ලබා දීමෙන් පසු එම ස්ථානය අධීක්ෂණය කිරීමේ වගකීම පැවරෙන්නේ කවුරුන්ටද;

(v) බොරලු කැපීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බලපවත්වන වර්තමාන නීති යාවත්කාලීන කිරීමට හෝ සංශෝධනය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1309/2025

ගරු චන්දන සූරියආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජාතික පාසැල්වලට හා පළාත් සභා පාසැල්වලට අනුයුක්ත කර ඇති මුළු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කරන ලද වර්ෂ සහ එම එක් එක් වර්ෂයේදී අනුයුක්ත කර ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රජයේ ගුරු පුරප්පාඩු පිරවීමේදී ඉහත සංවර්ධන නිලධාරීන් සඳහා යම් සහනයක් ලබා දිය හැකිද;

(iv) එසේ නම්, එම සහන කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ ගුරු පුරප්පාඩුවලට බඳවාගැනීම සඳහා පැවැත්වීමට නියමිතව තිබූ තරඟ විභාගයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවති නඩුව මේ වනවිට අවසන්වී තිබේද;

(ii) එසේ නම්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදී ඇති නිර්දේශ/නියෝග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1322/2025

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා, — අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ විශ්වවිද්‍යාවල ඉගෙනුම ලබන ආබාධ සහිත සිසුන් සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සිසුන්ගේ ආබාධ වර්ග කවරේද;

(iii) එම එක් එක් ආබාධ වර්ගයට අදාළ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයේ විශ්වවිද්‍යාලවලට ආබාධ සහිත සිසුන් ඇතුළත් කරගැනීමේ ක්‍රමවේදය කවරේද;

(ii) එම ක්‍රමවේදය යාවත්කාලීන සහ විධිමත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) රජයේ විශ්වවිද්‍යාල සඳහා ආබාධ සහිත සිසුන් ඇතුළත් කර ගැනීමේදී කෝටා ක්‍රමයක් ක්‍රියාත්මක වන්නේද;

(iv) ආබාධ සහිත සිසුන් සඳහා අන්තර්කරණීය අධ්‍යයන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර තිබේද;

(v) එසේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන ආකාරය කවරේද;

යන්නත් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අභිමත ඕනෑම විෂයධාරාවක් හැදෑරීමට විශ්වවිද්‍යාලවල ආබාධ සහිත සිසුන්ට අවකාශ තිබේද;

(ii) එම සිසුන් මේ වනවිට හදාරනු ලබන විෂයධාරාවන් කවරේද;

(iii) විවිධ විෂයධාරාවන් හැදෑරීමට ආබාධ සහිත සිසුන් යොමු නොවීමට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1346/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගන සංඛ්‍යාව කොපමණද;

(ii) ජාත්‍යන්තර මට්ටමේ නොවන එහෙත් ලෙදර් පන්දු ක්‍රිකට් ක්‍රීඩා කළ හැකි තණතීරු සහිත මුළු ක්‍රීඩාංගන සංඛ්‍යාව කොපමණද;

(iii) පාසැල් සතු ලෙදර් පන්දු ක්‍රිකට් ක්‍රීඩා කළ හැකි තණතීරු සහිත ක්‍රීඩාංගන සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පාසැල් ක්‍රිකට් ක්‍රීඩාව නැංවීම සඳහා අනුග්‍රහයක් ලබා දීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1351/2025

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ ජනතාවගේ ජීවනෝපායට මහත් රුකුලක් වන තල්ගස ශ්‍රී ලංකාවේ වැදගත් ශාකයක් ලෙස පිළිගැනීමට පියවර ගෙන තිබේද;

(ii) නොසැලකිලිමත්කම, නාගරීකරණය හා වන විනාශය හේතුවෙන් තල්ගස් විනාශ වීම වැළක්වීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) උතුරු පළාතේ තල් වගා කිරීම ව්‍යාප්ත කිරීමට විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබේද;

(iv) සෙසු පළාත්වලද තල් වගා කිරීමට කටයුතු කරන්නේද;

(v) තල් වගාව ව්‍යාප්ත කිරීමට පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාමූල සංවිධාන සම්බන්ධ කර ගන්නේද;

(vi) තල් වගා කිරීමට ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරන්නේද;

(vii) තල් සම්බන්ධයෙන් සංවර්ධන කොමිසමක් පිහිටුවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) තල් ආශ්‍රිත කුඩා කර්මාන්ත, ග්‍රාමීය ආයතන හා කාන්තා සමූපකාර සමිති දිරිගැන්වීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) තල් ආශ්‍රිත නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳපොළේ අලෙවි කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) එමඟින් ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ආදායම ඉහළ නැංවීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1353/2025

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දුර ගමන් සේවා බස්රථවල මගීන්ට ආහාරපාන හා සනීපාරක්ෂක පහසුකම් සපයන ආපන ශාලා/හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආපන ශාලා/හෝටල් සඳහා ලියාපදිංචියක් හෝ අවසරයක් තිබිය යුතුද;

(iii) එසේ නම්, ලියාපදිංචිය/අවසරය සහිත ආපන ශාලා/හෝටල් සංඛ්‍යාව කොපමණද;

(iv) ලියාපදිංචි කළ ආපන ශාලා/හෝටල් විසින් පිළිපැදිය යුතු නීති රීති පද්ධතියක් හෝ කොන්දේසි මාලාවක් තිබේද;

(v) එසේ නම්, ඒවා කවරේද;

(vi) එම ආපන ශාලා/හෝටල් ලියාපදිංචි කිරීමේදී ගාස්තුවක්/බද්දක් අය කරන්නේද;

(vii) එසේ නම්, එම ගාස්තුව/බද්ද කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1358/2025

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආබාධිත පුද්ගලයන්ට වෘත්තීය අධ්‍යාපනය ලබා දීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානවල මේ වනවිට පුහුණුව ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත මධ්‍යස්ථානවලට සිසුන් බඳවාගැනීමේ ක්‍රමවේදය කවරේද;

(iv) එම මධ්‍යස්ථාන සඳහා වාර්ෂිකව බඳවාගන්නා සිසුන් සංඛ්‍යාව කොපමණද;

(v) වෘත්තීය පුහුණුව ලබා ගැනීම සඳහා එම මධ්‍යස්ථානවලට වාර්ෂිකව ලැබෙන අයදුම්පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(vi) එම අයදුම්පත්‍ර අනුව බඳවා ගනු ලබන සිසුන් හැර ඉතිරි සිසුන් සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මධ්‍යස්ථානවල ප්‍රමාණවත් පරිදි පුහුණුකරුවන් සිටින්නේද;

(ii) නොඑසේ නම්, නව පුහුණුකරුවන් බඳවාගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඉහත මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1359/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් ඩිපෝවක් තිබෙන බවත්;

(ii) එම බස් ඩිපෝව සංචාරක කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ ආරුගම්බේ ප්‍රදේශයේ පිහිටුවා ඇති බවත්;

(iii) මේ වනවිට එම ඩිපෝව මගින් බස්රථ 10ක් පමණක් ධාවනයේ යොදවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඩිපෝව මගින් ආරුගම්බේ සිට කටුනායක සහ ඇල්ල වැනි ගමනාන්ත වෙත නව බස්රථ සේවා ආරම්භ කරන්නේද;

(ii) එම ඩිපෝව සඳහා ඉන්ධන පිරවුම්හලක්, නඩත්තු ඒකකයක් ඇතුළු මූලික පහසුකම් ලබා දෙන්නේද;

(iii) එම ඩිපෝව සඳහා නව බස්රථ ලබා දෙන්නේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1405/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේ සිට මේ දක්වා ත්‍රිකුණාමලය මහ රෝහල, මූතූර්, කින්නියා සහ කන්තලේ මූලික රෝහල් තුළ සිදු වූ මාසික දරු උපත් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම උපත් සංඛ්‍යාවට සාපේක්ෂව එම රෝහල්වල සිටිය යුතු වෛද්‍යවරුන් සංඛ්‍යාව, වෙනත් කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව සහ වෙනත් පහසුකම් සම්බන්ධයෙන් සමාලෝචනය කර එම රෝහල් සංවර්ධනය කිරීමට කටයුතු කර තිබේද;

(iii) ත්‍රිකුණාමලය රෝහලේ සිට මඩකලපුව, අනුරාධපුරය සහ පොළොන්නරුව වැනි ප්‍රධාන රෝහල් වෙත යොමු කරනු ලබන රෝගීන් මුහුණ දෙන දුෂ්කරතා සම්බන්ධයෙන් දන්නේද;

(iv) එයට පිළියමක් ලෙස ත්‍රිකුණාමලය මහ රෝහල සංවර්ධනය කිරීමට කටයුතු කරන්නේද;

(v) ඉහත රෝහල් අතරින් මධ්‍යම රජය සහ පළාත් සභාව විසින් පාලනය කරනුලබන රෝහල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) 2024 සහ 2025 වර්ෂයේ මේ දක්වා ඉහත එක් එක් රෝහලෙන් ප්‍රතිකාර ලැබූ නේවාසික සහ බාහිර රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2025 නොවැම්බර් 04 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

117/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මේ වනවිට ගෙවනු ලබන වැටුප් හා දීමනා කවරේද;

(iii) වැටුප් හා දීමනා නොගන්නා මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

206/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය ප්‍රතිශතයක් ලෙස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළ කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය පහළ ගොස් තිබේ නම්, ඊට හේතු කවරේද;

(iii) කෘෂිකාර්මික ක්ෂේත්‍රය වෙත තරුණයන් ආකර්ෂණය කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

219/2024

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2024 වර්ෂයේ නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ පැවති අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් විනාශ වූ කුඹුරු ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව අක්කරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ හේතුවෙන් වී අස්වැන්නේ සිදුවූ අඩු වීම කොපමණද;

(iii) විනාශ වූ කුඹුරු අතරින් නැවත වගා කරන ලද ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iv) විනාශ වූ කුඹුරු සඳහා වන්දි ලබාදී තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

229/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ නීතිපතිවරයා විසින් ඉල්ලා අස්කර ගන්නා ලද නඩු නැවත සමාලෝචනය කර සුදුසු නඩු නැවත පැවරීමට 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පොරොන්දුවී තිබේද;

(ii) වර්ෂ 2019 සිට 2024 දක්වා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඉල්ලා අස්කරගෙන ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එම නඩු අතරින් නැවත සමාලෝචනය කිරීමෙන් පසු නැවත පවරා ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(iv) වර්ෂ 2019 සිට 2024 දක්වා මූල්‍ය දූෂණ සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් මහාධිකරණයේ සහ මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩු අතරින් ඉල්ලා අස්කරගෙන ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම නඩු අතරින් නැවත සමාලෝචනය කර නීතිපතිවරයා විසින් නැවත පවරා ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

263/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන කවරේද;

(iii) මේ වනවිට එම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්යභාරය කවරේද;

(v) එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නම කවරේද;

(vi) ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

313/2024

ගරු රවී කරුණානායක මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පෞද්ගලික විදුලි ජනන සමාගම් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් සමාගමේ නම හා ලිපිනය සහ ජනන ධාරිතාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉහත සඳහන් එක් එක් සමාගම ලංකා විදුලිබල මණ්ඩලය වෙත සැපයූ විදුලි ඒකක සංඛ්‍යාව සහ ඒ සඳහා එක් එක් සමාගමට ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලි ජනන ධාරිතාව වැඩි කිරීම සඳහා ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

(v) එම විදුලි ජනනය සඳහා යොදා ගනු ලබන බලශක්ති ක්‍රමවේද පුනර්ජනනීය බලශක්තියද නැතහොත් තාප බල ශක්තියද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

340/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, පෝරතිව්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පෙරිය පෝරතිව් සහ පලුකාමම් යන ප්‍රදේශ සම්බන්ධ කරමින් ඉදිකර ඇති පාලම ප්‍රතිසංස්කරණය කළ යුතු බවත්;

(ii) එම පාලමෙන් ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම ජනතාවට දැඩි දුෂ්කර කාර්යයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත පාලම ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

622/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්තාවූ ආපදා සිද්ධීන් සංඛ්‍යාව, එම සිද්ධීන්වලදී ආපදාවන්ට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව සහ එම පුද්ගලයන්ට ගෙවන ලද වන්දි මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ආපදා කළමනාකරණය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) ලෝකයේ බොහෝ රටවල් ආපදා කළමනාකරණය සඳහා සුවිශේෂ අවධානයක් යොමු කරන බව දන්නේද;

(iv) ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

726/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෙරටට වර්ෂයකට ආනයනය කරනු ලබන අර්තාපල් අල ප්‍රමාණය කොපමණද;

(ii) ආනයනය කරනු ලබන අර්තාපල් අල සඳහා අය කරනු ලබන බද්ද කොපමණද;

(iii) මේ දිනවල නුවරඑළිය, වැලිමඩ, ඌව පරණගම සහ හපුතලේ යන ප්‍රදේශවල අර්තාපල් අල අස්වැන්න නෙලන බව දන්නේද;

(iv) එබැවින් ශ්‍රී ලංකාවේ අර්තාපල් අල අස්වැන්න නෙලන කාල වකවානුවේදී ශ්‍රී ලංකාවට අර්තාපල් අල ආනයනය නතර කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1430/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලංකාලගාල ග්‍රාම නිලධාරි වසමේ, හරක්ගමකන්ද ග්‍රාමයේ, අක්කර පහක පමණ විශාලත්වයකින් යුතු රජයේ ඉඩමක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට වෙන් කර තිබූ බව දන්නේද;

(ii) එම ඉඩම විධිමත් පරිදි සංස්ථාවට බැහැර කර තිබුණේද;

(iii) එම ඉඩම සංස්ථාව විසින් තෙවන පාර්ශ්වයකට ලබාදී ඇති බව දන්නේද;

(iv) එය නීත්‍යානුකූල වන්නේද;

(v) එම තෙවන පාර්ශ්වය කවුරුන්ද;

(vi) අදාළ තෙවන පාර්ශ්වය විසින් ගෙවීමට ඇති හිඟ බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිඟ බදු මුදල් ගෙවීමට තිබියදී, ඉහත ඉඩම පෞද්ගලික බැංකුවකට උකස් කර ණය මුදලක් ලබා ගැනීමට අනුමැතියදී තිබේද;

(ii) එසේ නම් එය, නීති විරෝධී නොවන්නේද;

(iii) ඉහත ඉඩම පැවරීමේදී සහ හිඟ බදු මුදල් ගෙවීමට තිබියදී ණයක් ලබා ගැනීමට කටයුතු කිරීමේදී, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව නීතිය උල්ලංඝනය කර තිබේද;

(iv) ඉහත ඉඩම නැවත රජයට පවරා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 නොවැම්බර් 06 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

679/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ දහනයෙන් පසු එකතු වන අළු විකිණීමෙන් 2015 වර්ෂයේ සිට මේ දක්වා උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අළු විකිණීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iii) එලෙස උපයන ලද ආදායමෙන් එම බලාගාරය අවට පදිංචිවී සිටින පාරිසරික ගැටලුවලට මුහුණදී සිටින ජනතාවගේ සුභසාධනය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

811/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ මහා නගර සභා බලප්‍රදේශයේ ඇති, මධ්‍යම රජයට සහ පළාත් සභාවට අයත් පාසැල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසැල්වල නම් කවරේද;

(iii) මේ වනවිට එම පාසැල්වල පවතින ගුරු හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් අධ්‍යාපන කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) කොළඹ මහා නගර සභා බලප්‍රදේශයේ ඇති පාසැල් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

818/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින් අතරින් මේ වනවිට වැටුප් වර්ධක අත්හිටුවා ඇති නිලධාරින් සංඛ්‍යාව එක් එක් සේවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් නිලධාරියාගේ නම, වැටුප් වර්ධකය අත්හිටවන ලද දිනය සහ ඊට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිලධාරින්ගේ වැටුප් වර්ධක නැවත ලබා දීම ඉතා මන්දගාමීව සිදු වන බව දන්නේද;

(iv) එම නිලධාරින් සම්බන්ධයෙන් කරනු ලබන පරීක්ෂණ කඩිනම් කර, වැටුප් වර්ධක ලබාදී ඔවුන්ට සාධාරණයක් ඉටු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

826/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 ජනවාරි 01 දින සිට මේ දක්වා ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ආයතනය ලබා ඇති සම්පූර්ණ අලාභය කොපමණද;

(ii) ඒ අතරින් මෙහෙයුම් අලාභය කොපමණද;

(iii) එම ආයතනය විසින් ගුවන්යානා සඳහා ගෙවනු ලබන වාර්ෂික ලීසිං වාරිකය/ණය වාරිකය කොපමණද;

(iv) එම ලීසිං වාරිකය/ණය වාරිකය ගෙවනු ලබන ගුවන්යානා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනය විසින් ලබා ගෙන ඇති මුළු ණය ප්‍රමාණය කොපමණද;

(ii) එම ණය වෙනුවෙන් වාර්ෂිකව ගෙවිය යුතු මුළු ණය වාරිකය කොපමණද;

(iii) එම ණය වාරිකයේ ඇති ප්‍රාග්ධන මුදල හා පොළී මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

851/2025

ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පල්ලෙකැලේ, දුම්බර බන්ධනාගාරයේ මේ වනවිට රඳවා සිටින රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම බන්ධනාගාරයේ රැඳවීමට හැකි රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම බන්ධනාගාරයේ නව ඉදිකිරීම් කඩිනම් කර, මේ වනවිට බන්ධනාගාරයේ පවතින තදබදය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

881/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන ‘දීමනා පත්‍ර’ (Deed of Grant) හෝ ‘ඉඩම් බලපත්‍ර’ (Land Permit) නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෛපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නීත්‍යානුකූලව ඉවත් කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වා වූ කාලසීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු පැවරූ පුද්ගලයන් අතරින් 2017.01.01 සිට 2025.03.31 දක්වා වූ කාලසීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටින්නේද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1062/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට නැවත වාහන ආනයනය කිරීමට අවසර ලබා දීමෙන් පසු මේ වනවිට ආනයනය කර ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලින් අය කර ගත යුතු බදු මුදල එන්ජින් ධාරිතාවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වාහන ආනයනය කිරීමෙන් උපයා ගැනීමට අපේක්ෂිත බදු මුදල සහ එයින් මේ වනවිට උපයා ගෙන ඇති බදු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට නැවත වාහන ආනයනය කිරීමට අවසර ලබා දීමෙන් පසු මේ වනවිට ආනයනය කර ඇති ත්‍රීරෝද රථ සංඛ්‍යාව සහ යතුරු පැදි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ආනයනික ත්‍රීරෝද රථයකට අය කරනු ලබන බදු මුදල කොපමණද;

(iii) ආනයනික යතුරු පැදියකට අය කරනු ලබන බදු මුදල එන්ජින් ධාරිතාවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1243/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024-2025 වර්ෂය තුළදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොඩ කිරීම සඳහා අනුමතිය ලබාදී ඇති අනුරාධපුර දිස්ත්‍රික්කයේ මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය, එම එක් එක් කුඹුරු ඉඩම හිමිකරුගේ නම, අනුමතිය ලබා දුන් කුඹුරු ඉඩමේ විශාලත්වය සහ අනුමතිය ලබා දීමට හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඊට අදාළව, ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අත්සනින් යුතුව නිකුත් කරන ලද ලිපිවල පිටපත් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1278/2025

ගරු අජිත් ගිහාන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වලින් ආයෝජන ව්‍යාපෘතිවලට ලබාදී ඇති ඉඩම් කවරේද;

(ii) එම එක් එක් ඉඩම ලබාදී ඇති ආයෝජන ව්‍යාපෘතිය, ඉඩමේ ප්‍රමාණය සහ පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් සඳහා ගෙවිය යුතු බදු මුදල් නියමිත පරිදි ගෙවා තිබේද;

(iv) නොඑසේ නම්, බදු මුදල් ගෙවීම පැහැර හැර තිබේද;

(v) ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දුන් ඉහත ඉඩම් සංවර්ධනය කර තිබේද;

(vi) ඒවා අතරින් ඌන සංවර්ධිත ඉඩම් හඳුනාගෙන තිබේද;

(vii) ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දුන් ඉහත ඉඩම් නිසි පරිදි සංවර්ධනය කර නොමැති නම් හෝ බදු ගෙවීම් පැහැර හැර තිබේ නම්, ඒවා නැවත පවරා ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ඉහත කොමිෂන් සභාවට අයත් මුළු ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉඩම්, නිවාස ඉදිකිරීම සඳහා ලබා දෙන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1327/2025

ගරු සුජීව දිසානායක මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති A, B, C සහ D ශ්‍රේණිවලට අයත් මාර්ගවල දුර එක් එක් ශ්‍රේණිය අනුව කිලෝ මීටර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ශ්‍රේණියට අයත් මාර්ග නඩත්තු කරනු ලබන ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2024 දක්වා මාර්ග සංවර්ධනය කිරීම සඳහා ආරම්භ කරන ලද ව්‍යාපෘති කවරේද;

(ii) එම ව්‍යාපෘතිවලින් සංවර්ධනය කරන ලද මාර්ගවල දුර කිලෝ මීටර්වලින් කොපමණද;

(iii) එම ව්‍යාපෘති මඟින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාර්ග ඉදිකර තිබේද;

(iv) එසේ නම්, එම මාර්ගවල දුර කිලෝ මීටර්වලින් කොපමණද;

(v) ඒ සඳහා වියදම් කරන ලද මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?